# සිංහල අවුරුද්දක ලද මියුරුතම අත්දැකීම

## ලෙබනනයේ සිංහල අළුත් අවුරුදු සිරිය



සිරයේ සිහිල හේම වී නැත. මෑත කඳු වළල්ල මතින් හමා එන සිහිල් සුළං රැල්ල මිහිරක් උපදවමින් වත දැවටෙනු දැනේ. නෙත ගැටෙනා සෑම තැනකම වන්නේ සොඳුරු නිල්ලය. මියුරු දසුන් මවනා කඳු පන්තිය. කඳු බෑවුම් අතරින් මතුවන මහල් මැඳුරින් සුසැදි ජනාවාස සමූහයය. පිවිතුරු මං මාවත්ය. කඳු බෑවුම් කෙළවර, අහස සේදී යනු සේ පිවිතුරු නිලෙන් දිලෙමින් අනන්තය තෙක් විහිදී යන නිසල මහ සයුරය. මැදපෙරදිග වැලිකතරේ උපන් කෙම්බිමේ අරුමය විඳිමින් හිඳිමි.

ලෙබනනය මෙපමණම වූ අසිරිමත් රටක් බව නොදැන සිටියෙමි. එහෙත් ඒ පිරුණු සොබා සිරිය මරණයේ රුදුරු හෙවණැලි තුළ සැඟව ගොස් ඇති අයුරු සිත තිගස්වයි. මහා ව්‍යසනයක් ආසන්නයේ එන බිහිසුණු නිසල බවේ මරණීය හැඟීම සෑම මොහොතකම මතුව සැඟව යනු දැනේ. ලෙබනනය පීඩා විඳින්නේ සිරියාවේ සිවිල් යුද්ධයේ දිගුවකිනි. මේ අර්බුදයේ ඵලයක් ලෙස ලෙබනනයේ ආගමික හා දේශපාලන දෘෂ්ඨිය මුල් කරගෙන අලුත් වටයකින් ඇවිලුන අවි ගැටුම් දැනට පුරා වසර තුනක කාලයක් තිස්සේ රට ව්‍යසනයකට ඇද දමමින් තිබේ. බෝම්බ ප්‍රහාර, මරාගෙන මැරෙන ප්‍රහාර වෙඩි තබා ගැනීම් පිළිබඳ බිහිසුණු පුවත් නොඇසෙන දිනයක් නොවේ. අන්තවාදී සංවිධාන වරෙක එළියට පැමිණ ඉලක්ක පුද්ගලයන්ට වෙඩි තබති. තානාපති කාර්යාල වලට පහර දෙති. බීරූට් නගර මධ්‍යයේ වීථි සටන් අවුළුවති. බටහිර ත්‍රාසජනක චිත්‍රපට ජවනිකාවන් සජීවීකරණය වන ආකාරය ජීවිතාපේක්ෂාවෙන් තොරව මිනිස්සු බලා හිඳිති. පසුගිය 2013 ජූනි මස සිට මේ වනතුරු ලෙබනනයෙන් වාර්තාවන බිහිසුණු මරාගෙන මැරෙන ප්‍රහාර ප්‍රමාණය පමණක් 25 ඉක්මවා යයි.

මෑත තෙවසරක සිදුවූ මේ ගැටුම් වලින් පමණක් සිවිල් මිනිසුන් පන්සියයකට අධික ප්‍රමාණයක් මරා දමා තිබිණි. කැරලි ඇතිවෙමින් තිබිණි. අවසානයේ උපන් ව්‍යාකූල දේශපාලන යථාර්ථයට මුහුණ දියහැකි නොවී ඉකුත් වසරේ මාර්තුවේදී අගමැතිවරයා ඉල්ලා අස්වී තිබිණි. එතැන් සිට මාස දහයක් රට අරාජික වූයේය. පසුගිය පෙබරවාරියේදී පත්වූ නව කැබිනට් මණ්ඩලයද මේ වටපිටාව තුළ කෙතරම් කාලයක් පවතීද යන්න සැක සහිතය. ලංකාවෙන් හයෙන් එකක් පමණ වූ මේ සොඳුරු බිම්පෙත ලෙයින් නැහැවී ඇති ආකාරය සිත කම්පා කරවයි.

විටින් විට මතුව බිහිසුණු රැලි නන්වන ලෙබනන් යුද්ධය ඇරඹෙන්නේ 1979 සිටය. මේ යුද්ධයේ ස්වරූපය නිසා මිලියන හතරක් පමණ ලෙබනන් ජනගහණය මෙන් තුන් ගුණයක්, එනම් මිලියන දොළහක් රට හැර ගොස්ය. ඔවුන් බොහෝමයක් දෙනා වෘත්තිකයන් සේ උපයන මුදලින් මවුරට පෝෂණය කරති. නුදුරු අතීතයේදී යුද්ධයේ මාරක අත්දැකීම් ලාංකීය සමාජය ත්‍රස්ත කළ ආකාරය පිළිබඳ මතකය මේ මොහොතේ බීරූට් නගරයේ සිට අත්දකිමි.

ඒ අත්දැකීම් විඳිමින් ශ්‍රී ලාංකිකයෝ අසූපන් දහසක් ලෙබනනයේ ජීවත් වෙති. ශ්‍රී ලාංකිකයන් උදෙසා උසස් රැකියා අවස්ථාවන් ලෙබනනය තුළ නොවේ. මේ අසූපන්දහසකට ආසන්න පිරිස අතර වෘත්තිකයෝ නොවෙති. මේ පිරිසෙන් සියයට අනූවක් ගෘහ සේවයට පැමිණි කාන්තාවන්ය. ඔවුන්ගෙන් පිරිසක් වාර්ෂික කොන්ත්‍රාත්තුවකට නිවසක සේවය සඳහා පැමිණි වීසා සහිත ගෘහ සේවිකාවන්ය. තවත් පිරිසක් ලෙබනන් ජාතිකයන්ට වාර්ෂිකව මුදලක් ගෙවා වීසා මිලදී ගෙන සේවය කරන නිදහස් සේවිකාවන්ය. තවත් පිරිසක් නීතියෙන් පිට පැන වීසා රහිතව සිටිනා නීති විරෝධී පිරිස්ය. මේ සියල්ලෝම ජීවත් වීම සඳහා අරගල කරති. ඒ අරගලය අතර විඩාපත් ජීවිත සනසා ගන්නට වින්දනීය ඉසව් සොයති.












සංස්කෘතිය තුළ ස්ථාවර කළ ස්වකීය පවුල් පරිසරයෙන් බිඳී මරණය හා සමාන වෙන්වීමකින් පසු ඈත දුරු රටක තනිවූ මේ ශ්‍රී ලාංකිකයෝ එක්ව සිංහල අලුත් අවුරුදු සමරති. අවුරුදු උත්සව කරති. අප මෙසේ ලෙබනනයට පැමිණෙන්නේ තුන්සිය හැටපස් දවසේම මහා ජීවන අරගලයක යෙදෙමින් රටට විනිමය උපදවන මේ හුදකලා මිනිසුන්ගේ අවුරුදු සිරිත දකිනු රිසියෙනි.

අවුරුදු උළෙල සංවිධානය වන්නේ ලෙබනන් ශ්‍රී ලංකා සිංහල සංගමයෙනි. සංගමයේ සභාපති මහින්දසිරි, ලේකම් නලින් ප්‍රනාන්දු, භාණ්ඩාගාරික කාන්ති සිල්වා ඇතුළු කණ්ඩායම මේ කටයුත්තේ බර දරති. උපදෙස් හා මඟපෙන්වීම ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති රංජිත් ගුණරත්නයන්ගෙනි. ලෙබනන් ජාතික කතෝලික බැතිමත්හු ජීවමාන දේව මෑණියන් දකිනු සේ තරණය කරනා හරිස්සා පල්ලිය පිහිටි කඳු පාමුල වූ ජූනියේ නගර සභා ක්‍රීඩාංගනය ජීවයෙන් පිරුණු ශ්‍රී ලාංකිකයන්ගේ මියුරු සිනාවෙන්ද සාද කතාවෙන්ද විකසිත වනු උපන්a ආනන්දයෙන් යුතුව අසා හිඳිමි. ඉරිදාවේ ඔවුහු සියල්ලෝම පාහේ වැඩ වලින් මිදී විවේකීව ගත කරති. එබැවින් අවුරුදු උදාවට පෙර ඉරිදාව (13 දා) අවුරුදු උළෙල සඳහාම සැරසුණු ඉරිදාවක් වී තිබිණි.

සියල්ල මනාකොට පෙළ ගැසී තිබේ. එකෙළිවන අවුරුදු සිරිය විඳින්නට ජූනියේ නගරසභා ක්‍රීඩාංගනයට ශ්‍රී ලාංකිකයෝ රොද බැඳගෙන පැමිණෙති. ඔවුන් සමරනු ලබන්නේ අර්ථපූර්ණ අවුරුද්දක් බව හඟිමි. මෙවන් අරුත්බර අවුරුදු උත්සවයක් මැදපෙරදිග හෝ වෙනත් රටක තබා අපේ රටතුළවත් පවත්වන්නට ඇතැයි නොසිතමි. මේ උළෙලේ ප්‍රධාන ආරාධිතයන් වටකොට ගත් හපුටු දේශපාලකයන් නොවේ. රූමත් නළු නිළියන් නොවේ. අවුරුදු උත්සවය සරසන්නට ඇරයුම් ලබන්නී දිලේකා කසුනි හේරත් නමැති දිරිය දියණියයි. ඇයට ලෝකය කියා දුන් ඇගේ ගුරු මවය. ලොවේ මියුරු හඬ කිසි දිනෙක නොඇසූ මේ දිරිය දියණිය උසස්පෙළ විශිෂ්ට සාමාර්ථ තුනක් සහිතව සමත්ව කී අරුත්බර කතාව දිවයිනේ තරංග රත්නවීර ලෝකයට කීවේය. ඒ කතාව ලෙබනනයට ඇසී තිබිණි. ලෙබනන් ශ්‍රී ලංකා තානාපති රංජිත් ගුණරත්නයන්ගේ අදහස් ප්‍රකාරව ලෙබනනයේ සිංහල සංගමයේ ආරාධනාව ලැබ මේ බක්මහ උළෙල සරසන්නට පැමිණ තිබුණේ ඒ දිරිය දියණිය හා ඇයට ජීවිතය කියා දුන් ඇගේ විශේෂ අධ්‍යයන ගුරුවරිය ය. පොල්තෙල් පහන දල්වමින් උළෙල ආරම්භ කරන්නේ දිලේකා දියණියයි. ඇය සමග එක්වන්නේ තානාපති කාර්යාල පරිශ්‍රය තුළ, ලෙබනන් තානාපති රංජිත් ගුණරත්න හා වසන්තා ගුණරත්න දෙපළ විසින් ශ්‍රී ලාංකික දරුවන් උදෙසා පවත්වාගෙන යන, ලෙබනනයේ ශ්‍රී ලංකා පාසලේ දරුපැටවුන්ය.

ජූනියේ නගරසභා පිටිය අවුරුදු සිරියෙන් එකෙළිවනු පෙනේ. මෙවන් මොහොතක නිසැක ගැටුම් උපදවන, සමහර සිංහල කාන්තාවන් හා සහවාසයෙන් දිවිගෙවන බංගලි, හින්දි, සිරියානු ජාතීන් ඇතුළු ශ්‍රී ලාංකික නොවන විදේශිකයන්ට ක්‍රීඩාංගනයේ දොරටුව විවෘත වන්නේ නැත. ලෙබනනයේ තේ කඩයකදීත් මත්පැන් බෝතල් මිලදී ගත හැකිය. එහෙත් අවුරුදු උත්සව භූමිය තුළට මත්පැන් රැගෙන ඒම තහනම්ය. දකින්නේ මනා විනයකින් යුතුව සිංහල ජන ක්‍රීඩා පෙළගැසෙමින් ඇති අයුරුය. තැනෙක කොට්ට පොරයකි. තැනෙක කඹ ඇදීම සිදු වේ. තවත් තැනෙක කණා මුට්ටිය බිඳීමය. කුඩා දරුවෝ තරගයට බනිස් කති. සිඟිති අවුරුදු කුමාරියට සැරසෙති. විවිධ ඇඳුම් තරග වලට ඉදිරිපත් වෙති. වේදිකාව මත ජන ගී ගායනා තරගයකි. විටෙක එය මනරම් සංස්කෘතිකාංගයන්ගෙන් පිරී යයි. සියල්ලෝම මේ සංස්කෘතික මංගල්‍යයේ අසිරිය විඳිති. දුරු රටක ධනයෙන් ආඪ්‍ය කුවේරයන්ගේ ගෘහ සේවය සඳහා පැමිණි මේ දුගී මිනිසුන් තුළ සැඟව ඇති පොහොසත් කලා නෛපුණ්‍යය දුටුවන් මවිත කරවනු බලා සිටියෙමි.

අවුරුදු උත්සවය අතර එකිනෙකා පැමිණ දිලේකා දියණිය හමුවෙති. කතා කරති. ඡායාරූප ගනිති. ඇයගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මුදල් ලබා දෙති. ලෙබනන් ශ්‍රී ලංකා පාසලේ දෙමවුපියන් වන සුනේත්‍රා දසනායක, ශාන්ති කමලාංගනී, පද්මා කුමාරි, ගංගා පීරිස්, තුෂාරි, සෝනියා, උදය සරත් කුමාර, රේණුකා නිශ්ශංක, අනුලාවතී ඇතුළු ආදරණීය මිනිස්සු ඇයගේ උසස් අධ්‍යාපන කටයුතු නිමාවන තුරු මාසිකව ඇයට රුපියල් අට දහසක ශිෂ්‍යත්ව මුදලක් ප්‍රදානය කරති. මේ හැම සිදුවීමක් අතරම අතිශය මානුෂික කතාවක් තිබේ. ශිෂ්‍යත්වයට දායක වන අනුලාවතී අවිවාහකය. නෑදෑ හිතමිතුරන් නැත. සාක්ෂරතාවක් නැත. ලෙබනනයේ දශක දෙකක කාලයක් ගතකර ඇත. -මට මේ දුවට උගන්වන්න ඕන. ලබන ආත්මෙවත් මට මෙහෙම දුකක් නොවෙන්න ප්‍රාර්ථනා කරනවා." ඇය අප සමග කීවාය.

දිලේකාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා ශිෂ්‍යත්ව අරමුදල හැර ලෙබනනයේ ශ්‍රී ලාංකිකයන් විසින් ලබා දී තිබූ මුදල රුපියල් ලක්ෂ දෙකකට ආසන්නය. දිලේකා දියණියගේ සරසවි ජීවිතයේ ආර්ථික ගැටලු මේ ශ්‍රී ලාංකිකයන් විසින් විසඳා දී තිබිණි. කම්කරු වෘත්තියේ නියැළෙමින්, ගෘහ සේවයේ යෙදෙමින්, අප්‍රමාණ දුර්භෝගම වළඳා තමන් උපයන මුදලින් කොටසක් මෙවන් සද් කාර්ය යක් වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන මේ මිනිසුන්ගේ ඉතිරෙන මනුෂ්‍යත්වය දෙස පිරුණු සිත් ඇතිව බලා සිටියෙමි.

සිංහල අවුරුදු උළෙල ලෙබනනයේ ශ්‍රී ලාංකිකයන් එකට එක් කරන ප්‍රධානම ඉසව්වය. මේ ඉසව්ව සංවිධානය වන්නේ ලෙබනන් තානාපතිවරයාගේ උපදෙස් අනුවය. උපන් රට තුළදීම අසරණ වීමෙන් අනතුරුව ජීවිතයට මුහුණ දීම සඳහා දුරු රටකට පැමිණ ශ්‍රමය වගුරුවන පීඩිත මිනිසුන් වෙසෙන රටක ප්‍රායෝගික තානාපතිවරයකු පිළිබඳව වන ආදර්ශය ලෙබනන් තානාපති රංජිත් ගුණරත්නයන්ගෙන් දකිමින් හිඳිමු. හේ සම්භාවනීය අසුනින් බැස මිනිසුන් අතර හැසිරෙයි. සියලු කටයුතු අධීක්ෂණය කරයි. විටෙක ව්‍යක්ත ලෙස අවුරුදු උත්සවය මෙහෙයවයි. අපේ රටට ආගන්තුක රාජ්‍ය තාන්ත්‍රිකයකුගේ ප්‍රායෝගික පරිපාලන රිද්මය අප තුළද බලාපොරොත්තු උපදවයි.

ගලා එන මඳ සිහිල ගත සුවපත් කරවයි. මෑත ගිරිමත නැඟුණු හරිස්සා පල්ලිය සියුම් මිහිදුම් පටලයකින් වැසී යනු පෙනේ. පිරී ඉතිරෙන දයාවෙන් යුතු බැල්මෙන්, පහත් තැන්නෙහිවෙසෙනා අසරණ මිනිසුන් දෙස නෙත් යොමා හිඳිනා ලෙබනනයේ දේවමෑණියන්ගේ වත ඒ මිහිදුම් තිර අතර සැඟව ගොස්ය. හාත්පස මියුරු සිනහවෙන් පිරි මිනිසුන්ගේ සොඳුරු සල්ලාපය අසමි. ගමේ කමතේ සැරසෙන සිංහල අවුරුදු උත්සවයක අතීත මිහිර මේ ඈත රට තුළ හිඳ මේ මිනිසුන් විසින් විඳිනු ඇතැයිs සිතමි. තමන් පෙළුE නිර්දය පීඩාව මොහොතකට අමතක කරන මිනිසුන් ස්වකීය විඩාපත් හැඟීම් පුළුන් රොදක් සේ පාකර හරින අයුරු දකිමි. සිංහල අවුරුද්දක ලද හැකි මියුරුතම අත්දැකීම මෙය නොවේදැයි මේ මොහොතේත් කල්පනා කරමි.

ජානක ලියනආරච්චි ලෙබනනයේ සිට